" විශිෂ්ට රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE
204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொதுவான இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 SYSTEM CERTIFIED
SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/ADM/30-38/FI/01 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2024.07. 15 |
|---|---|---|---|---|---|

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාරවර කාර්යාලය (බ.ප)
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප.)
සභා ලේකම්, බස්නාහිර පළාතේ පළාත් සභා ලේකම් කාර්යාලය (බ.ප.)
ලේකම්,(පළාත් පාලන/අධ්‍යාපන/කෘෂිකර්ම/ප්‍රවාහන/සෞඛ්‍ය) අමාත්‍යාංශය (බ.ප.)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස් හා පුහුණු/මූල්‍ය/සැලසුම්/ඉංජිනේරු)
පළාත් ආදායම් කොමසාරිස් (බ.ප.)
ප්‍රධාන නීති නිලධාරී,නීති ඒකකය (බ.ප.)
අධ්‍යක්ෂ,අභ්‍යන්තර විගණන ඒකකය (බ.ප.)
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්

**මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.**

උක්ත කරුණට අදාලව පහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/6/2/19 හා 2024.07.08 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015 (V) හා 2024.06.27 | රාජ්‍ය සේවයේ විධායක ශ්‍රේණියේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම |

02. මෙම චක්‍රලේඛ පිටපත් ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර ඇති අතර, එකී චක්‍රලේඛය පරිදි කටයුතු කරන ලෙස ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානින් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

නදීෂා ඩී. සපරමාදු,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන).
ප්‍රධාන ලේකම් වෙනුවට,
බස්නාහිර පළාත.

දුරකථන අංකය : 011-2092608
ෆැක්ස් අංකය : 011-2092609
විද්‍යුත් ලිපිනය : cswpadm@gmail.com

4.05 pm (71)

# බස්නාහිර පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය
## மேல் மாகாண ஆளுநர் பணிமனை
## GOVERNOR'S OFFICE - WESTERN PROVINCE

අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල. | இல. 204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல. | No. 204, Denzil Kobbekaduwe Mawatha Battaramulla.

ඔබේ අංකය. / உமது இல. / Your Ref: CSWP/ADM/30-38/FI/01
මගේ අංකය / எனது இல. / My Ref: GOS/ADM/6/2/19
දිනය / திகதி / Date: 2024.07. 08

"ජනතා හිතවාදී විශිෂ්ඨතම පළාත් රාජ්‍ය සේවාවක්" -" பொது மக்களுக்கு சிறந்த பொதுச் சேவை " -" People Friendly Excellent Public Service "

15 JUL 2024

ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත.

**<u>මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ ( මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාල කර ගැනීමේ කමිටු තීරණ සඳහා අනුමැතිය ලබා ගැනීම.</u>**

උක්ත මැයෙන් යුතුව මා අමතන ලද ඔබේ සමාංක හා 2024.07.04 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව පහත සඳහන් චක්‍රලේඛය බස්නාහිර පළාතට අදාළ කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

| චක්‍රලේඛ අංකය | චක්‍රලේඛ නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(V) | 2024.06.27 | රාජ්‍ය සේවයේ විධායක ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම. |

සෝමසිරි පල්ලත්තරගේ
ආණ්ඩුකාර ලේකම්
බස්නාහිර පළාත

දුරකතන අංක - 0112092816
ෆැක්ස් - 0112092813
විද්‍යුත් තැපැල - governoroffice@secgov.wp.gov.lk

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2015(V)

මගේ අංකය : EST-7/03/ALW/2012
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07

2024.06.27

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## <u>රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට විශේෂ දීමනාවක් ලබා දීම</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015, 2015.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(I), 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(II), 2019.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(III) සහ 2020.01.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(IV) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2015.07.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(I) හි පළමු ඡේදයේ පරිදි සුදුසුකම් ලබන රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ නිලධරයන්ට මෙතෙක් සේවා කාලය මත පදනම්ව ගෙවන ලද විශේෂ දීමනාව වෙනුවට සේවා කාලය නොසලකා රු.25,000/- ක විශේෂ මාසික දීමනාවක් ගෙවීමට 2024.06.24 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. මෙම දීමනාව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ සහ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ නිලධරයන්ට ද හිමිවේ.

03. තවද, 2015.06.26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015 නිකුත් කිරීමෙන් පසුව එම චක්‍රලේඛය සහ එයට ආනුෂංගිකව නිකුත් කළ චක්‍රලේඛවල හිමිකම සමඟ එයට අතිරේකව සේවාවෙහි/තනතුරෙහි සුවිශේෂිතාව සැළකිල්ලට ගෙන, විශේෂ දීමනා අනුමත කළ සේවාවලට/තනතුරුවලට අයත් නිලධරයන්ට මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනට අදාල විධිවිධාන අනුව හිමි වන දීමනාව/දීමනා රු.25,000/- ට වඩා අඩු නම්, ඔවුනට එම දීමනාව/දීමනා සහ මෙම චක්‍රලේඛය මඟින් හිමි වන රු.25,000/- අතර වෙනස පමණක් ගෙවිය යුතු වන අතර, එම දීමනාව/දීමනා රු.25,000/- ට සමාන හෝ ඊට වඩා වැඩි වන්නේ නම්, එම දීමනාව/දීමනා මෙම චක්‍රලේඛයට අනුව සංශෝධනය නොකළ යුතුය.

04. ඒ අනුව, 2020.01.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015(IV) මඟින් තාවකාලිකව අත්හිටුවන ලද අංක 18/2015(III) දරන 2019.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය 2024.06.30 දින සිට අවලංගු කෙරෙන අතර, 2011.12.12 දිනැති අංක 28/2011 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන්ට, 2013.11.12 දිනැති අංක 23/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන්ට මෙන්ම අමප/13/1466/533/016 හා 2013.10.31 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි අංක 41.07 තීරණය අනුව ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ නිලධරයන්ට එකී විධිවිධාන අනුව ගෙවනු ලබන දීමනා 2024.07.01 දින සිට ගෙවනු නොලැබේ.

05. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන අතර, මෙම චක්‍රලේඛ විධිවිධාන 2024.07.01 දින සිට ක්‍රියාත්මක වේ.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 011-2697233
ෆැක්ස් : 011-2692158
විද්‍යුත් තැපැල : ade-vii@pubad.gov.lk